# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 42 — 1973 ජනවාරි 12 වැනි සිකුරාදා — 1973.01.12

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 17 |
| ජනාධිපතිතුමාණන් කරන පත් කිරීම් ආදිය ... ... | — | මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත්කිරීම් ආදිය ... ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ආදයම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත්කිරීම් ආදිය ... | — | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 17 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 24 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — | "සුරාබද්ද අඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


සැළකිය යුතුයි.—(i) මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත 1973 ජනවාරි 05 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී. (ii) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 18 දරණ විසර්ජන පනත 1973 ජනවාරි මස 12 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළවේ.

## වෙනත් පත්කිරීම් ආදිය

**1973 අංක 10**

ජී. ඩී. 4/1 (ii)

පහත නම් සඳහන් පොලිස් පරීක්ෂකවරුන් 1972 නොවැම්බර් මස 1 වැනි දින සිට සහකාර පොලිස් අධිකාරි වරුන් ලෙස වැඩ බැලීමට පත් කිරීම ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යවරිය විසින් නියෝගකර ඇත :—

(1) එන්. ඒ. වීරක්කොඩි මහතා
(2) ඉසෙඩ්. සී. ඊ. විජේසූරිය මහතා
(3) එම්. මහෙස්වරන් මහතා.

ඩී. ඊ. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1972 දෙසැම්බර් මස 27 වන දින,
කොළඹ 1,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ දීය.

1-471

## ආණ්ඩුවේ නිවේදන

**ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

119 වැනි වගන්තිය යටතේ බලතල පැවරීමේ ආඥාව

මුදල් ඇමති නානායක්කාර පතිරගේ මාටින් පෙරේරා වන මම, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 119 (1) වැනි වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පෙර පැවති පූර්ව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරා තිබුණු පරිදි, මෙහි උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් දෙපාර්තමේන්තුවල සේවාවේ නියුක්ත ඒකාබද්ධ වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් වර්ෂයකට රු. 6,720ට අඩු රාජ්‍ය නිලධාරීන්ගේ සේවයෙන් පහ කිරීම හා විනය පාලනය පිළිබඳ සියලු බලතල 1972 මැයි 22 දින සිට වෙනයම් නැතහොත් තවදුරටත් විධිවිධාන යොදනු ලබන තෙක්, ඉහතකී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අදාල බලතල පැවරීමේ ආඥාවල හා නීතිවල සඳහන් පරිදි, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එම වගන්ති හා කොන්දේසි යටතේ, එහෙත් පහත සඳහන් කොන්දේසිවලට යටත්ව, එම රාජ්‍ය නිලධාරීන් වෙත ම පවරා දෙනු ලැබූ බලතල ලෙස සැලකිය යුතුයයි නියෝග කරමි :—

(අ) දැන් එබඳු බලතල, විනය නීතිවලට හා අමාත්‍ය මණ්ඩලය විසින් හෝ මා විසින් හෝ කලින් කල නිකුත් කරනු ලැබිය හැකි වෙනයම් හා වැඩිදුර උපදේශවලට ද අනුකූලව ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය.

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1971 මාර්තු මස 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. ඩී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

(ආ) සම්බන්ධ රාජ්‍ය නිලධාරියකුට පවරා දෙනු ලැබූ සම්බන්ධ දඬුවම් කිරීමේ බලතල මා විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 119(1) වැනි වගන්තිය ප්‍රකාරව මා විසින් තීරණය කරනු ලැබූ කිසියම් කාරණයක් සම්බන්ධව සේවයෙන් පහකිරීමේ හෝ වෙනයම් ආකාරයකින් දඬුවම් කිරීමේ හෝ කිසියම් බලතලයක් රාජ්‍ය නිලධාරියකු විසින් ක්‍රියාත්මක කරනු නොලැබිය යුතුය.

(ඇ) මා විසින් පවරා දෙනු ලැබූ බලතල යටතේ කරන ලද සේවයෙන් පහකිරීමේ නියෝගයක් ඇතුළු විනයානුකූල කාරණයකට අදාළ කිසියම් නියෝගයක් මගින් අසහනයට පත් රාජ්‍ය නිලධාරියකුට ඒ පිළිබඳව ව්‍යවස්ථාවේ 119 වැනි වගන්තිය යටතේ අවශ්‍ය වියහැකි පරිදි රාජ්‍ය සේවා විනය මණ්ඩලය වෙත හෝ මා වෙත හෝ අභියාචනය කළ හැකිය.

ඉහත සඳහන් කරන ලද පූර්ව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවරා දෙනු නොලැබ එම සභාව විසින් ම ක්‍රියාත්මක කරන ලද සේවයෙන් පහකිරීම හා විනය පාලනය පිළිබඳ බලතල, ඒ කාබද්ධ වාර්ෂික වැටුපේ ආරම්භය රු. 6,720 ට අඩු රාජ්‍ය නිලධාරීන් සම්බන්ධයෙන් ද, අමාත්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද විනය නීතිවලට හා අමාත්‍ය මණ්ඩලය විසින් හෝ මා විසින් නිකුත් කරනු ලබන වැඩිදුර නොහොත් වෙනයම් නියෝගවලට යටත්ව දැන් මෙහි උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කර ඇති ඒ ඒ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යයි මම මෙයින් නියෝග කරමි.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් ඇමති.

1972 දෙසැම්බර් මස 23 දින,
කොළඹ,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

### උපලේඛනය

මුදල් අමාත්‍යාංශ කාර්යාලය.

මහා භාණ්ඩාගාරය.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව.

රේගු දෙපාර්තමේන්තුව.

තක්සේරු දෙපාර්තමේන්තුව.

පුරාබද්ධ දෙපාර්තමේන්තුව.

ණය මණ්ඩලය.

1-472

### පඩිපාලක සභා ආඥාපනත

#### නිවේදනයයි

1972 අගෝස්තු මස 10 වැනි දින සිට අවුරුදු තුනක කාලයක් තුළ (චොකලට් සෑදීම ඇතුළු) විස්කෝතු හා රසකැවිලි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයින් වශයෙන් පෙනී සිටීමට (136 වන අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 9 වැනි වගන්තිය යටතේ කම්කරු ඇමතිතුමන් විසින් පහත නම් සඳහන් තැනැත්තන් පත් කරන ලද බව වර්ෂ 1971 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 30 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ලේකම්.

1972 දෙසැම්බර් මස 28 වැනි දින,
කොළඹ දීය.

**නම නියමකොට පත් කරන ලද සාමාජිකයින් :**

(1) ආචාර්ය කමල් කරුණානායක මහතා
(2) ජී. ඩබ්ලිව්. ජයසූරිය මහතා
(3) එල්. ආර්. පෙරේරා මහතා

**සේව්‍ය නියෝජිත සාමාජිකයින් :**

(1) ඊ. ඩී. වීරකෝන් මහතා
(2) කේ. ජී. එන්. සෙනෙවිරත්න මහතා
(3) එෆ්. සී. පෙරේරා මහතා
(4) ඕවන් ගුණවර්ධන මහතා
(5) කේ. විලියම් සිංඤෝ මහතා
(6) එෆ්. කරුණාකලගේ මහතා
(7) ඒ. බී. සුන්දරරාජ් නායගු මහතා
(8) ඇස්. සිවරාජා මහතා
(9) ජී. ඩී. වික්‍රමරත්න මහතා
(10) ඊ. එස්. අප්පදොරේ මහතා

**සේවක නියෝජිත සාමාජිකයින් :**

(1) ඇම්. ඇම්. සෙනෙවිරත්න මහතා
(2) ඇම්. සී. ඇම්. ෂරීෆ් මහතා
(3) එච්. ඩබ්ලිව්. කල්දේරා මහතා
(4) එම්. බී. පිලපිටිය මහතා
(5) එම්. ඒ. හනීෆා මහතා
(6) ආර්. පීටර් මහතා
(7) ටී. ආර්. කාලෝ මහතා
(8) එස්. සිරිවර්ධන මහතා
(9) එඩ්වඩ් බොතේජු මහතා
(10) ඇල්. ඩබ්ලිව්. පණ්ඩිත මහතා

1-427

---

ඇල්.ඩී.—බී 68/50.

මෙහි වූ උපලේඛනයේ i වැනි තීරුවේ නිශ්චය කොට දක්වා ඇති අමාත්‍යවරුන් විසින්, ඒ උපලේඛනයේ ii වැනි තීරුවේ අනුරූප සටහන්වල නිශ්චය කොට දක්වා ඇති නිලධාරීන්, ඒ උපලේඛනයේ iii වැනි තීරුවේ අනුරූප සටහන්වල දැක්වෙන තනතුරුවලට පත්කිරීම අවශ්‍යවන්නා වූ සෑම විටකම එසේ පත්කිරීමට, (2 වැනි අධිකාරය වන) අර්ථ නිරූපණ ආඥාපනතේ 12 වැනි වගන්තිය යටතේ මට බලය පවරා දී ඇති බව පොදු දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

1950 ජූලි මස 14 වැනි දින අංක 10,123 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද, 1950 ජූලි මස 7 වැනි දින දරන නිවේදනය, එය යටතේ දැනටමත් කර තිබෙන පත්වීම්වලට කිසිදු හානියක් සිදුනොවන අයුරින්, මෙයින් ඉවත් කරනු ලැබේ.

ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

1973 ජනවාරි මස 1 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

| (i) | (ii) | (iii) |
|---|---|---|
| 1. විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යවරයා | ආණ්ඩුවේ ඒජන්තවරු, ආණ්ඩුවේ අතිරේක ඒජන්තවරු, ආණ්ඩුවේ ඒජන්තවරුන්ගේ කායර්ාල සහකාරවරු | නැව් පුන්බුන් භාර ගැනීමේ නිළධාරීන් |
| | ආණ්ඩුවේ ඒජන්තවරු සහ ආණ්ඩුවේ අතිරේක ඒජන්තවරු ... | කිරුම් සහ මිනුම් අධිකාරීවරු |
| 2. නැව් කටයුතු හා සංචාරක කටයුතු අමාත්‍යවරයා | යාපනය, මන්නාරම, වවුනියාව, මඩකලපුව සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ආණ්ඩුවේ ඒජන්තවරු | නියෝජ්‍ය මාස්ටර් ඇටෙන්ඩන්ට්වරු |
| | යාපනය, මන්නාරම, වවුනියාව, මඩකලපුව සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ආණ්ඩුවේ අතිරේක ඒජන්තවරු හෝ ආණ්ඩුවේ ඒජන්තවරුන්ගේ කාර්යාල සහකාරවරු | සහකාර මාස්ටර් ඇටෙන්ඩන්ට්වරු |
| 3. මුදල් අමාත්‍යවරයා ... ... | ආණ්ඩුවේ ඒජන්තවරු, ආණ්ඩුවේ අතිරේක ඒජන්තවරු, ආණ්ඩුවේ සහකාර ඒජන්තවරු, ආණ්ඩුවේ ඒජන්තවරුන්ගේ කායර්ාල සහකාරවරු | රේගු අයකැමිවරු හෝ සහකාර රේගු අයකැමිවරු හෝ අතිරේක රේගු අයකැමිවරු හෝ අතිරේක සහකාර රේගු අයකැමිවරු හෝ ගොඩබෑම් සමීක්ෂකවරු |

| I | II | III |
|---|---|---|
| 4. අධිකරණ අමාත්‍යවරයා | ... කොළඹ, මහනුවර, ගාල්ල, යාපනය, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුරය, බදුල්ල සහ රත්නපුර පාලන දිස්ත්‍රික්කවල ආණ්ඩුවේ ඒජන්තවරු | ස්වකීය පළාත්වල පිස්කල්වරු |
| | ආණ්ඩුවේ ඒජන්තවරු, ආණ්ඩුවේ අතිරේක ඒජන්තවරු, ආණ්ඩුවේ සහකාර ඒජන්තවරු, ආණ්ඩුවේ ඒජන්තවරුන්ගේ කායයාංල සහකාරවරු හෝ අතිරේක කායයාංල සහකාරවරු | ස්වකීය පාලන දිස්ත්‍රික්කවල නියෝජ්‍ය පිස්කල්වරු |

1-477

---

**වර්ෂ 1954 සාප්පු සහ කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) රෙගුලාසි**

වේතන විනිශ්චය මණ්ඩලවලට පත් කෙරෙන සභික නාම ලේඛනය.

(1) කම්කරු කොමසාරිස්වරයාගෙන් සහ

(2) 1973 ජනවාරි මස 01 වැනි දින සිට (129 වැනි පරිච්ෙඡ්දය වන) සාප්පු සහ කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතේ 25(1) වගන්තිය යටතේ ඇමතිවරයා විසින් පත් කරනු ලැබ සිටින, පහත නම් දක්වෙන තැනැත්තන්ගෙන්—

සංයුක්ත වන බව වර්ෂ 1954 ඔක්තෝබර් 15 වැනි දින හා අංක 10,724 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1954 සාප්පු සහ කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) ව්‍යවස්ථා සංග්‍රහයේ 31 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

(අ) **සේව්‍ය නියෝජිතවරු :**

1. ඩී. එස්. ඉලයප්පෙරුම මහතා
2. කේ. වී. ගුණසේන මහතා
3. එච්. පෝල් සිල්වා මහතා
4. ඩී. ෆ්‍රෙඩ් ජයසිංහ මහතා
5. ජී. ටී. එෆ්. ප්‍රනාන්දු මහතා
6. සී. විජේනායක මහතා
7. එම්. ඩබ්ලිව්. ජයරත්නම් මහතා
8. ටොම් ප්‍රනාන්දු මහතා
9. ඒ. සන්ගදාස සිල්වා මහතා
10. ජෝයි එෆ්. පෙරෙසිරා මහතා
11. ජේ. අබේවික්‍රම මහතා
12. එන්. ෂෙවක්‍රම් මහතා

(ආ) **සේවක නියෝජිතවරු :**

1. විමලසිරි ද මැල් මහතා
2. ඇන්. ෂන්මුගදාසන් මහතා
3. ඇල්. ඩබ්ලිව්. පණ්ඩිත මහතා
4. එස්. සෙල්ලයියා මහතා
5. ඒ. ඩී. ඊ. විජේතුංග මහතා
6. වෝල්ටර් ජෝතිපාල මහතා
7. ඩොනල්ඩ් රත්නවීර මහතා
8. ඩබ්ලිව්. එල්. ප්‍රනාන්දු මහතා
9. පී. සුමතිරත්න මහතා
10. එම්. බී. එච්. එම්. පීරිස් මහතා
11. ඔස්වින් ප්‍රනාන්දු මහතා
12. ඩබ්ලිව්. කේ. විජේමාන්න මහතා

(ඇ) **නම නියමකොට පත් කළ සාමාජිකවරු :**

1. පී. ආර්. වික්‍රමනායක මහතා
2. ඒ. එච්. එම්. ෆවුසි මහතා
3. කේ. ඔගස්ටින් ඩයස් මහතා
4. ඩබ්ලිව්. මාලිමාරච්චි මහතා
5. සී. ඇල්ප්‍රඩ් ද සිල්වා මහතා
6. පී. සිරිදරන් මහතා
7. ජේ. ඩී. සී. පෙරේරා මහතා
8. ඒ. ඩී. කනගරත්න මහතා
9. සී ඒ. සිම්ත්‍රාරච්චි මහතා
10. පී. විමලචන්දිරන් මහතා
11. ආර්. ආර්. සෙල්වදොරෙයි මහතා

ඇ. එ. ගෝගලී මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ලේකම්.

1972 දෙසැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

1-378

**මිල පාලන පනත**

මිල පාලක (ආහාර හා විවිධ ද්‍රව්‍ය) විසින් පනවනු ලැබූ, 1972 ඔක්තෝබර් මස 9 වැනි දින අංක 28/5 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1972 අංක 3 දරණ (ලාම්පු මැන්ටල්) මිල පාලන ආඥාව, විදේශීය හා දේශීය වෙළඳ ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබූ බව, (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතේ 4(7) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජයන්ත කැලේගම,
ලේකම්,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය.

1972 දෙසැම්බර් 23 වැනි දින,
කොළඹ දීය.

1-305/1

---

**මිල පාලන පනත**

මිල පාලක (ආහාර හා විවිධ ද්‍රව්‍ය) විසින් පනවනු ලැබ, 1972 ඔක්තෝබර් මස 9 වැනි දින අංක 28/5 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1972 අංක 1 දරණ (සැනටෝජන්) මිල පාලන ආඥාව සහ 1972 අංක 1 දරණ (සස්ටජන්) මිල පාලන ආඥාව, විදේශීය හා දේශීය වෙළඳ ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබූ බව (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතෙහි 4(7) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජයන්ත කැලේගම,
ලේකම්,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය.

1972 දෙසැම්බර් මස 22 වැනි දින,
කොළඹ දීය.

1-305/2

---

**සමගි මණ්ඩල පනත**

ආඥාව

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කිය විය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම—

(ඈ) 1971 මැයි මස 7 වැනි දින අංක 14,957 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උප ලේඛනයෙහි අංක 21 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ අම්පාර දිස්ත්‍රික්කය තුල පිහිටි උඩ පළාත ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජික යන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි.

1. බක්කිඇල්ල, අංක 36/152 හි පදිංචි වීරසිංහ ආරච්චිගේ හෝමපාල මහතා.
2. බක්කිඇල්ල, අංක 36/47 හි පදිංචි රණවීර රත්නතිලක පලිහන වලව්වේ රත්බණ්ඩා මහතා.
3. බක්කිඇල්ල, රජගලතැන්න, අංක 34/112 හි පදිංචි අලුත්ගේ සේනන් සිංඤෝ මහතා.
4. බක්කිඇල්ල, පරණගම, අංක 3/12 හි පදිංචි සමරකෝන් මුදියන්සේලාගේ විදානෙගෙදර විජයරත්න මහවල මහතා.

5. බක්කිඇල්ල, ගොණාගොල්ල, අංක 33/117 හි පදිංචි මාරසිංහ මුදියන්සේලාගේ සුදුබණ්ඩා මාරසිංහ මහතා.

6. බක්කිඇල්ල, ගලපිටගල, අංක 32/153/3 හි පදිංචි මාඉනාගොඩගේ ඇඩ්වින් ගුණපාල මහතා.

7. බක්කිඇල්ල, ගලපිටගල නිවෙස, අංක 32/50 හි පදිංචි ඩාර්ලිස් සිංඤෝ සුදුසිංහ මහතා.

8. කොහොඹාන, කොත්මලේ ජනපදය අංක 55 හි පදිංචි අලුත්දූරගේ ගුණසේකර මහතා.

9. බක්කිඇල්ල, ගෝණගල, අංක 31/146 හි පදිංචි හේරත් මුදියන්සේලාගේ පුංචිබණ්ඩාර මහතා.

10. කොහොඹාන, මායාදුන්න, අංක 30/81 හි පදිංචි ගමගේ දොන් සේතන් සිංඤෝ මහතා.

11. කොහොඹාන, සේනාගම, අංක 29/24 හි පදිංචි සමරතුංග දේවයලාගේ විජයපාල මහතා.

12. කොහොඹාන, වැරන්කැටගොඩ, අංක 28/83 හි පදිංචි වීරතුංග ආරච්චිගේ හින්නිඅප්පුහාමි මහතා.

13 .කොහොඹාන, වලගම්පුර, අංක 27/83 හි පදිංචි සුභසිංහ මුදියන්සේලාගේ හේරත් මහතා.

14. කොහොඹාන, පරණගම, අංක 7/102 හි පදිංචි වනසිංහ මුදියන්සේලාගේ ධර්මසේකර මහතා.

15. කොහොඹාන, බන්ඩාරදූව, පදිංචි තලා බන්ඩාරලාගේ ගුණවර්ධන මහතා.

(ආ) බක්කිඇල්ල, අංක 36/152 හි පදිංචි වීරසිංහ ආරච්චිගේ හේමපාල මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවෙහි සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තෙකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1972 දෙසැම්බර් මස 28 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

1-362/1

---

### සමගි මණ්ඩල පනත

#### ආඥාව

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කිය විය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1971 මැයි මස 7 වැනි දින අංක 14,957 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උප ලේඛනයෙහි අංක 22 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ අම්පාර දිස්ත්‍රික්කය තුළ පිහිටි මැදපලාත ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජික යන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි.

1. උහන, කුමාරිගම, අංක 20, වි. සේ. ස. සමිතිය, පදිංචි මාතොට ගමරාලලාගේ ජයසේන මහතා.

2. උහන, අංක 23/139 හි පදිංචි දිසානායක මුදියන්සේලාගේ ගුණතිලක මහතා.

3. පරගහකැලේ, අංක 2/9 හි පදිංචි අත්තනායක මුදියන්සේලාගේ තීසාහාමි අත්තනායක මහතා.

4. උහන, කුමාරිගම, ජයසිරි ස්ටෝස් හි පදිංචි ඕකන්දපොල ආරච්චිගේ සුරවීර මහතා.

5. උහන, අංක 20/38 හි පදිංචි වේරවැල්ලලාගේ නන්දාවා මහතා.

6. උහන, අංක 22/105 හි පදිංචි රන්කොත් ගෙදර නන්ද සේන මහතා.

7. උහන, දෙමටමල් පැලැස්ස, අංක 22/80 හි පදිංචි මීගොන් පට්ටි ගෙදර කිරා මහතා.

8. උහන, කුමාරිගම, අංක 15 හි පදිංචි එදිරිසූරිය මුදියන්සෙලාගේ සිරිවර්ධන මහතා.

9. උහන, කුමාරිගම, ජනපද අංක 20/118 හි පදිංචි සිංගප්පුලි මුදියන්සේලාගේ තිලකරත්න රාළහාමි මහතා.

10. උහන, අංක 24/76 හි පදිංචි හේවා ජුලිගේ සැමියෙල් මහතා.

11. උහන, හිම්දුරාව අංක 40 හි පදිංචි නාරංකොටුවේ ගෙදර සේකර මහතා.

12. උහන, හිම්දුරාව, අංක 26 හි පදිංචි මිල්ලගහ මැද ගෙදර ජයසේන මහතා.

13. උහන, ගලහිටියාගොඩ, 23/154 හි පදිංචි හල්පාගොඩ මුදියන්සේලාගේ පොඩි අප්පුහාමි මහතා.

14. උහන, කල්මූන පාර, අංක 5 හි පදිංචි හේරත් මුදියන් සේලාගේ සභානායක මහතා.

15. උහන, තිස්සපුර, අංක 21/122 හි පදිංචි කියුන් හැල්ල රාලලාගේ ධම්දාස මහතා.

16. උහන, තිස්සපුර, අංක 21/37 හි පදිංචි මේනානායක අමරසිංහගේ ප්‍රේමරත්න මහතා.

(ආ) උහන, කුමාරිගම, අංක 20, වි.සේ.ස. සමිතියේ මාතොට ගමරාලලාගේ ජයසේන මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1972 දෙසැම්බර් මස 28 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

1-362/2

---

### සමගි මණ්ඩල පනත

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3(7) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින් නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි පැල්මඩුල්ල ගම් ප්‍රදේශය සඳහා 1970 නොවැම්බර් මස 20 වැනි දින අංක 14,933 දරන ගැසට් නිවේදනය මගින් සංස්ථාපනය කරනු ලැබූ සමගිදායක සභාවේ සාමාජික ඕපනායක, මොරතොට පදිංචි වීරකෝන් ආරච්චිගේ සිරිසේන වීරකෝන් මහතා එකී නිලයෙන් ඉවත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1972 දෙසැම්බර් මස 28 වැනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේදී ය.

1-361

---

### සමගි මණ්ඩල පනත

#### ආඥාව

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1970 අගෝස්තු මස 28 වැනි දින අංක 14,921 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 9 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි කිරලව කෝරලේ නැගෙනහිර ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) මඩාටුගම, කිතුල්හිටියාව, පදිංචි ටී. බී. දසනායක මහතා.

(2) මඩාටුගම, "නිහතමානී" පදිංචි ඕ. ඇම්. අබ්දුල් කාදර් මහතා.

(3) මඩාටුගම, බන්ඩාර පොතාන පදිංචි ඇම්. ඇම්. මොහමඩ් අලි මහතා.

(43 ගලේවෙල, දඹුලුහල්මිල්ලවැව පදිංචි පී. බී. පියසේන මහතා.

(5) මඩාටුගම, හැවැන්තැන්නේගම පදිංචි එච්. ජී. ඇන්. බන්දුසේන මහතා.

(6) ගල්කිරියාගම, රනව පදිංචි ආර්. කේ. විජේරත්න මහතා.

(7) මඩාටුගම, කොටාගල පදිංචි කලුබන්ඩාගේ රන්බන්ඩා මහතා.

(8) මඩාටුගම, කිතුල්හිටියාව, 1074 පදිංචි කේ. බී. ජයසේකර මහතා.

(9) මඩාටුගම, උඩනිදිගම පදිංචි ඇම්. මොහමඩ් ඉස්මයිල් මහතා.

(10) දේවහුව, නාරංගස්වැව, 12/9 පදිංචි චන්ද්‍රරත්න තෙන්නකෝන් මහතා.

(11) දේවහුව, නාරංගස්වැව පදිංචි කේ. එම්. එච්. බන්ඩාර මහතා.

(12) ගලේවෙල, දඹුලුහල්මිල්ලැව තෙලදින්නන්වැව පදිංචි ඕ. සන්තා මහතා.

(13) මඩාටුගම, හැවැන්තැන්නේගම පදිංචි කේ. බී. දිසානායක මහතා.

(14) දේවහුව, නාරංගස්වැව, 8/95 පදිංචි එච්. එම්. ජයතිලක මහතා.

(15) මඩාටුගම, කිතුල්හිටියාව, පදිංචි කේ. ජී. ඩේවිඩ් මහතා.

(16) ගලේවෙල, කැලෑ ගිල්මිල්ලවැව පදිංචි ඇන්. බී. කපුරාල මහතා.

(17) මඩාටුගම, කොටාගල, පදිංචි බී. මුතුබණ්ඩා මහතා.

(18) දේවහුව, 12/9 පදිංචි ටී. ඇම්. හෙන්ද්‍රික් අප්පුහාමි මහතා

(19) දේවහුව, 29/9, පදිංචි යූ. රොමා මහතා.

(ආ) මඩාටුගම, කිතුල්හිටියාව පදිංචි ටී. බී. දසනායක මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවෙහි සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු 3 ක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1972 දෙසැම්බර් මස 23 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

1-555/1

---

**සමගි මණ්ඩල පනත**

**ආඥාව**

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කිය විය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1972 මාර්තු මස 24 වැනි දින අංක 15,003 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 10 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටි මාකඳුර ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි:—

(1) ගෝනාවිල මාකඳුර පදිංචි සමරප්පුලි ආරච්චිගේ පියසේන මහතා.

(2) ගෝනාවිල, හෙණ්ඩියගල, 'රත්නවිලා' හි පදිංචි නවරත්න අධිකාරී මුදියන්සේලාගේ සමරසේන මහතා.

(3) ගෝනාවිල, ගෝනුල්ල පදිංචි සුබසිංහ මුදියන්සේලාගේ කරුණාරත්න මහතා.

(4) ගෝනාවිල ගෝනුල්ල "නේරන්ජා" හි පදිංචි අලගිය වන්න මොහොට්ටාලලාගේ තිලකරත්න මහතා.

(5) කු/ගෝනාවිල නාලවලාන "සිරිගිරි" හි පදිංචි ජයකොඩි ආරච්චිගේ ඇන්තනි අප්පුහාමි මහතා.

(6) ලීහිරියාගම, හෙට්ටිරිප්පුව පදිංචි ඉඟුරුවත්තගේ මයිකල්වැන් සස් ලාවුස් ප්‍රනාන්දු මහතා.

(7) ලීහිරියාගම, හෙට්ටිරිප්පුව, පන්සල පාර පදිංචි අබේසිංහ මුදියන්සේලාගේ සයිමන් අබේසිංහ මහතා.

(8) වැලිපැන්නාගහමුල්ල, පන්නරේ පදිංචි රත්නායක මුදියන්සේලාගේ ඩිංගිරි බණ්ඩා මහතා.

(9) ගෝනාවිල, මාකඳුර පදිංචි ජයසුන්දර මුදියන්සේලාගේ ධර්මදාස මහතා.

(10) වෙල්පල්ල පදිංචි අදිකාරි මුදියන්සේලාගේ කිරි මුදියන්සේ අදිකාරි මහතා.

(11) වෙල්පල්ල පදිංචි කුරුප්පු මුදියන්සේලාගේ අමරසීල රත්නායක මහතා.

(12) ලීහිරියාගම හෙට්ටිරිප්පුව පදිංචි අබේසිංහ මුදියන්සේලාගේ පියදාස අබේසිංහ මහතා.

(13) සඳලංකාව, ඉරබඩගම පදිංචි මණ්ඩලවල්ලි ආචාරිගේ මහින්ද පීරිස් මහතා.

(14) ගෝනාවිල, නාලවලාන පදිංචි මාරසිංහ මුදියන්සේලාගේ ඇල්බින් සිංඤෝ මහතා.

(15) ගෝනාවිල, නාලවලාන පදිංචි විතාරණගේ ජෝශප් මරියා ප්‍රනාන්දු මහතා.

(16) සඳලංකාව, ඉරබඩගම පදිංචි රත්වත්තේගේ ආරිය රත්න මහතා.

(17) සඳලංකාව, ගලගෙදර පදිංචි ගජමුතු ලංකාතිලක චන්ද්‍රප්පුලි මාටින් මහතා.

(18) සඳලංකාව, ගලගෙදර පදිංචි වඩනාගලුගේ ගිරිගෝරිස් ප්‍රනාන්දු මහතා.

(19) ගෝනාවිල, මදුරුගමුව පදිංචි විජේසිංහ ආරච්චිල්ලාගේ ගුණරත්න මහතා.

(20) සඳලංකාව, හෙමුඩාව පදිංචි එදිරිප්පුලිගේ ජිනදාස මහතා.

(21) සඳලංකාව, හෙණ්ඩියගල පදිංචි රාජපක්ෂ මුදියන්සේලාගේ ඇල්බින් සිංඤෝ මහතා.

(22) ගෝනාවිල, විලගෙදර පදිංචි හේමතිලක ගුණසිරි ජයසිංහ මහතා.

(23) ගෝනාවිල, නාලවලාන පදිංචි බියන්විලගේ පීරිස් සිංඤෝ මහතා.

(24) වෙල්පල්ල, නාගම, රද්දලාන පදිංචි අධිකාරි ආරච්චිගේ සුමතිපාල මහතා.

(25) වැලිපැන්නාගහමුල්ල, පන්නරේ පදිංචි හේරත් මුදියන්සේලාගේ පොඩි අප්පුහාමි මහතා.

(26) ගෝනාවිල, එලිවිල පදිංචි හේරත් මුදියන්සේලාගේ විමලසේන මහතා.

(27) සඳලංකාව පදිංචි සුබසිංහ මුදියන්සේලාගේ ඇසොන් සුබසිංහ මහතා.

(28) ලීහිරියාගම, සුන්දිරාපොල පදිංචි ගරුසිංහ දේවගේ ඇල්බැනිස් මහතා.

(29) ගෝනාවිල, දැරළුව පදිංචි හේරත් මුදියන්සේලාගේ සනී විජේසේකර මහතා.

(30) වෙල්පල්ල, රාවිට, පදිංචි ඉම්යා මුදියන්සේලාගේ ජිනදාස මහතා.

(ආ) ගෝනාවිල මාකඳුර පදිංචි සමරප්පුලි ආරච්චිගේ පියසේන මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1972 දෙසැම්බර් මස 23 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

1-555/2

### තානායම් පනත

ආණ්ඩුවේ ඒජන්තවරුන් යටතේ පාලනය වන තානායම් සම්බන්ධයෙන් අංක 37 සහ 1972 දෙසැම්බර් 08 දින දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කර ඇති තානායම් රීති මාලාවේ උප ලේඛනයෙහි මත්පැන් මිළ ගණන් ලැයිස්තුවේ දැක්වෙන අරක්කු අලෙවි මිල පහත දැක්වෙන උප ලේඛනයේ ප්‍රකාරව සංශෝධනය කර ඇත.

සංශෝධිත මිළ ගණන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිතුමා විසින් අනුමත කර ඇති අතර, ඒවා 1973 ජනවාරි මස 1 දින සිට ක්‍රියාත්මක වනු ඇත.

බී. මහාදේව,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

1973 ජනවාරි මස 3 දින,
කොළඹ දීය.

මත්පැන් මිළ ගණන්

| අරක්කු | ඩ්‍රෑම් 1ක් | ඩ්‍රෑම් ½ක් |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| මෙන්ඩිස් ස්පෙෂල් අරක්කු | 5 0 | 2 50 |
| දෙවරක් පෙරූ අරක්කු | 5 0 | 2 50 |
| ඉතා විශේෂ අරක්කු | 2 60 | 1 30 |
| ලංකා අරක්කු | 2 10 | 1 05 |
| විශේෂ අරක්කු | 1 10 | 0 55 |
| ඉක්ෂුපාක අරක්කු | 1 10 | 0 55 |

1/462

---

### 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥව ජාතික රාජ්‍ය සභා අතුරු මැතිවරණය—1972.10.09 අංක 21—කැස්බෑව මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් මන්ත්‍රීවරයෙකු පත් කිරීම

ඉහත කී මැතිවරණයේ මන්ත්‍රීධුරාපේක්ෂකයෙකුවූ ඩී. ඒ. ප්‍රේමන් මහතාගේ මැතිවරණ වියදම් පිළිබඳ වූ වාර්තාව සහ එම වාර්තාවට සම්බන්ධවූ ප්‍රකාශයන් ද, 1972 නොවැම්බර් මස 22 වෙනි දින මා වෙත ලැබුණ බවත්, මෙම දැන්වීම ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ දා සිට ඉදිරියට ඇති හය මාසය තුළදී, රුපියල් එකක ගාස්තුවක් ගෙවීමෙන්, එකී වාර්තාව හා ප්‍රකාශයන් ද කාර්යාල වේලාවන් තුළ ඕනෑම විටක දී, කොළඹ කච්චේරියේ මැතිවරණ කාර්යාලයේ දී පරීක්ෂා කළ හැකි බැව්, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ් සභා ආඥවේ 71 (1) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇස්. ඇන්. රාජා,
සහකාර තෝරීම්භාර නිලධාරි තැන,
අංක 21—කැස්බෑව මැතිවරණ කොට්ඨාශය.

මැතිවරණ කාර්යාලය,
කච්චේරිය, කොළඹ,
1972 දෙසැම්බර් මස 5 වැනි දින.

1-475

---

මගේ අංකය: ඊ7/912.

### කාර්මික ආරවුල් පනත (131 වන පරිච්ඡේදය)

1957 අංක 14 හා 62, 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, 131 වන පරිච්ඡේදය වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 1971 දෙසැම්බර් මස 7 වැනි දින දරන නියෝගයෙන් යොමු කරන ලදුව, 1971 දෙසැම්බර් මස 17 වන දින අංක 14,989 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකරන ලද, එක්සත් රාජ්‍ය සංස්ථා සහ වෙළඳ සේවක සංගමය, 53, ජයන්ත වීරසේකර මාවත, කොළඹ 10 සහ ලංකා ට්‍රයිකොට්න් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ්, 29—3/2, ගෆ්පූර් ගොඩනැගිල්ල, කෙළින් වීදිය, කොළඹ 1 අතර පැවතුන කාර්මික ආරවුල පිළිබඳව බේරුම්කරු විසින් මා වෙත එවන්ට යෙදුන තීරණය ඉහත සඳහන් කරන ලද පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් පළකරනු ලැබේ.

ජෝ. පී. එ. සිරිවර්ධන,
වැඩබලන කම්කරු කොමසාරිස්.

1972 දෙසැම්බර් මස 23 වන දින,
කොළඹ 5, කම්කරු දෙපාර්තමේන්තුවේදී ය.

ඒ. 1108
එක්සත් රාජ්‍ය සංස්ථා සහ වෙළඳ සේවා සංගමය,
53, ජයන්ත වීරසේකර මාවත,
කොළඹ 10.

සහ

ලංකා ට්‍රයිකොට්න් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ්
29, 3/2, ගෆ්පූර් ගොඩනැගිල්ල,
කෙළින් වීදිය, කොළඹ 1.

අතර පවතින කාර්මික ආරාවුල.

#### නියෝගය

ඉහත සඳහන් කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා ගරු ඇමති තැන්පත් ඇම්. පී. ද. ඉසෙඩ් සිරිවර්ධන මහත්මා කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ අප වෙත යොමු කොට ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරාවුලට හේතුවී තිබුනු කරුණු නම් :—

(1) යූ. එස්. සිල්වා, යූ. ඩී. රණසිංහ, පී. බැසිල්, ඇම්. ඒ. පොන්සේකා, බී. ඒ. සාලි, ආරියපාල කරුණාතිලක, ඊ. දයාරත්න සහ ඩී. ඒ. ජයතිස්ස යන අයගේ සේවය ලංකා ට්‍රයිකොට්න් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ් විසින් අත්හිටවීම යුක්ති සහගතද යන්නත්, ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමිද යන්නත්,

(2) ඇස්. නිත්‍යනාදන්, ඇම්. එච්. ඇම්. පෙරෝස්, ජෝසප් ඇන්තනි, ඩබ්. පී. ජේ. ඩබ්ලිව්. පෙරේරා, රාජා පඩිනන්දස් බර්ට් රුද්රිගු, ජේ. ශ්‍රී ජයකුමාර්, සහ ඩබ්. පී. වින්සන්ට් යන මහතුන් ලංකා ට්‍රයිකොට්න් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ් විසින් සේවයෙන් පහ කිරීම යුක්ති සහගතද යන්නත්, ඔවුන් එකිනෙකාට කුමන සහනයන් හිමිද යන්නත්,

(3) රුපියල් 150 ක අවම වැටුපක් ගෙවීම හා රුපියලේ අගය අඩුවීම නිසා ගෙවිය යුතු රුපියල් 10 ගෙවීම සම්බන්ධව ගිවිසුම ක්‍රියාත්මක නොකිරීම යුක්ති සහගතද යන්නත්, මෙම සේවකයන් එකිනෙකාට කුමන සහනයක් හිමිද යන්නත් සහ

(4) 1970 වර්ෂය සඳහා යූ. ඇස්. සිල්වා හා ඇම්. ඒ. පොන්සේකා යන අයවළුන්ට ප්‍රසාද දීමනා නොගෙවීම යුක්ති සහගතද යන්නත්, ඔවුන් එකිනෙකාට කුමන සහනයන් හිමිද යන්නත් පිළිබඳව වේ.

නඩුව ආරම්භයේදීම ආරාවුලට හේතුවී තිබුණු තුන්වන කරුණ වන "රුපියලේ අගය අඩුවීම නිසා ගෙවිය යුතු අමතර දීමනා පිළිබඳ ගිවිසුම ක්‍රියාත්මක නොකිරීම" පිළිබඳ ප්‍රශ්නය වගඋත්තරකාර සමාගම විසින් නිරාකරණය කොට තිබුනි. එම ගිවිසුම අනුව, ගෙවිය යුතු වැටුප යථා පරිදි ගෙවාගෙන යන බව වගඋත්තරකාර පක්ෂය පෙන්වා දුන් පසු ඉල්ලුම්කාර පක්ෂය විසින් එම ඉල්ලීම අත්හැර දමා ඇත.

නඩු වාර දෙක තුනකදී නඩුව සමථයකට පත් කිරීම සඳහා අප ගත් වෑයමේ ප්‍රතිඵලයක් වශයෙන් වගඋත්තරකාර සමාගම සේවය නතර කර සිටි සහ, සේවය අත්හිටවා සිටි සියලු සේවකයන් අතුරෙන්, සොරකම් චෝදනාවකට අසුව සිටි යූ. ඩී. රණසිංහ සහ පී. බැසිල් යන දෙදෙනා අත්හැර අනෙකුත් හැම දෙනාටම නැවත රැකියාව දීමට පොරොන්දු විය. ඒ අනුව ඒ හැම දෙනාම 1972 සැප්තැම්බර් මස 1 වෙනිදා සිට වැඩට ගැනීමට වගඋත්තරකාර සමාගම එකඟ විය. ඒ අනුව, ඒ හැම දෙනාම 1972 සැප්තැම්බර්

මස 1 වෙනිදා සිට සේවයට ගෙන ඇති බව, 1972 ඔක්තෝබර් මස 11 වෙනි දින දෙපාර්ශවයම දන්වන ලදී. එම සේවයට ගත් අය අතුරෙන් යූ. එස්. සිල්වා, ඇම්. ඒ. පොන්සේකා සහ ඊ. දයාරත්න යන තිදෙනාගේ වැඩ නවතා තිබූ පසුගිය අවුරුදු දෙක තුල පඩි බාගය බැගින් ද, හිඟ මුදල් පිළිබඳව ඔවුන් නැවත වැඩට ගොස් මාස 6 කට පසුව වගඋත්තරකාර සමාගමේ පාලක මණ්ඩලයෙන් ඉල්ලා සිටීමට දෙපාර්ශවයම එකඟ වී ඇත. මේ අනුව ආරවුලට තුඩු දුන් හතරවෙනි කරුණද සමතයකට පත් විය. 1972 සැප්තැම්බර් මස 1 වෙනිදා සිට සොරකම් චෝදනාවට අසුවූ පී. බැසිල් සහ යූ. ඩී. රණසිංහ යන දෙදෙනා අත්හැර අනික් සේවකයින් සමාගමේ සේවයට ගත් නිසා ආරවුලට හේතුවී ඇති 1, 2 යන කරුණු වලින් ද විසඳීමට ඉතිරි වූයේ බැසිල් සහ රණසිංහ යන අයට කුමන හසනයක් හිමිද යන ප්‍රශ්නය පමණකි. ඔවුනට එදිරිව නගා තිබුණු චෝදනා ගැන සලකා බැලූ ඉල්ලුම්කාර පක්ෂය ඔවුන් පිළිබඳ ඉල්ලීම් ඉල්ලා අස් කර ගැනීමට 1972 ඔක්තෝබර් මස 11 වෙනිදා එකඟ විය. එසේ වුවද, ඔවුන් කරන ලද සේවය ගැන සලකා බලා පාරිතෝෂික දීමනාවක් හැටියට රණසිංහට රුපියල් 600 ක් ද, බැසිල්ට රුපියල් 180 ක් ද ගෙවීමට වගඋත්තරකාර පක්ෂය එකඟ විය. 1972 ඔකතෝබර් මස 26 වෙනි දින එම මුදල් එම දෙදෙනාට මෙම උසාවියේදී ගෙවන ලදී. ඉහත සඳහන් පරිදි මෙම නඩුව සමථයකට පත් කොට ඇති කොන්දේසි සාධාරණ සහ යුක්ති සහගත බව සහතික කරමින් මෙම නඩුව මෙසේ සමථයකට පත් කරමි.

1972 ඔක්තෝබර් මස 26 වෙනි දින නාරාහේන්පිට පිහිටි කම්කරු දෙපාර්තමේන්තුවේ, කාර්මික අධිකරණයේදී මෙම තීරණය ප්‍රදානය කන ලදී.

ප්‍රජාපාල ශ්‍රී ගුණවර්ධන,
බේරුම්කරු.

1972.12.05 දින.

1-369

---

අංක : පි 7/1005.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡෙදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි**

මෙම නියෝගය අනුබද්ධිත වැඩබලන් කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිතකර දක්වා ඇති කාරණය පිළිබඳව

හෝටල්, බේකරි, සාප්පු සහ බීම කම්කරු සමිතිය,
71, මැලේ වීදිය,
කොළඹ 2.

සහ

ද ජ්‍ජ්නා කෝපරේටිව් ස්ටෝස් ලිමිටඩ්,
420, හොස්පිටල් රෝඩ්, යාපනය.

අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා කම්කරු විනිශ්චය සභා අංක 8 වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1972 දෙසැම්බර් මස 28 දින,
කොළඹ දීය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

හෝටල්, බේකරි, සාප්පු සහ බීම කම්කරු සමිතිය,
71, මැලේ වීදිය,
කොළඹ 2.

සහ

ද ජ්‍ජ්නා කෝපරේටිව් ස්ටෝස් ලිමිටඩ්,
420, හොස්පිටල් රෝඩ්, යාපනය.

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණ නම්, ද ජ්‍ජ්නා කෝපරේටිව් ස්ටෝර්ස් ලිමිටඩ්හි පාලක පක්ෂය විසින් ඉහත සඳහන් සමිතියේ සාමාජිකයන් වන ඊ. වරදරාජා, කේ. අරුලානන්දන්, ඇස්. තවචෙල්ලම්, වී. තුරේසිංහම්, ඇස්. තිලේනාදන් සහ කේ. නඩරාජා යන මහතුන්ට 1970-71 වර්ෂය සඳහා පාරිතෝෂික දීමනා නොගෙවීම යුක්ති සහගතද යන්නත්, ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

1972 දෙසැම්බර් මස 16 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ජෝ. පි. ඒ. සිරිවර්ධන,
වැඩබලන කම්කරු කොමසාරිස්.

1-466

---

අංක : ටී 23/කො. 576/72.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි**

මෙම නියෝගය අනුබද්ධිත වැඩබලන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිතකර දක්වා ඇති කාරණය පිළිබඳව, අයිවන් ජේ. ආනන්දප්පා මහතා, 615/3, මීගමුව පාර, කුරණ, කටුනායක සහ ද කලම්බු ඇපොතිකරිස් කොම්පැනි ලිමිටඩ්, තැ. පෙ. අංක 31, කුමාර වීදිය, කොටුව, කොළඹ, අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 6, කොලිංවුඩ් පෙදෙසේ, අංක 22 හී ඩබ්ලිව්. ඩී. තමෝදරම් මහතා වෙත මෙයින් යොමුකරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1972 දෙසැම්බර් මස 28 දින,
කොළඹ දීය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

අයිවන් ජේ. ආනන්දප්පා මහතා,
615/3, මීගමුව පාර, කුරණ, කටුනායක.

සහ

ද කලම්බු ඇපොතිකරීස් කොම්පැනි ලිමිටඩ්,
තැ. පෙ. අංක 31, කුමාර වීදිය, කොටුව, කොළඹ.

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණ නම්, ද කලම්බු ඇපොතිකරීස් කොම්පැනි ලිමිටඩ් සඳහා 1959.06.01 වන දින සිට 1970.09.29 වන දින දක්වා කරනලද පූර්ව සේවාව සඳහා, ද කලම්බු ඇපොතිකරීස් කොම්පැනි ලිමිටඩ් හි පාලන පක්ෂයයන් අයිවන් ජේ. ආනන්දප්පා මහතා පාරිතෝෂික දීමනා ඉල්ලා සිටීම යුක්ති සහගතද යන්නත්, එසේනම්, ඔහුට කුමන ප්‍රමාණයක පාරිතෝෂික දීමනාවක් ගෙවිය යුතු ද යන්නත් පිළිබඳව වේ.

1972 දෙසැම්බර් මස 21 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ජෝ. පී. ඒ. සිරිවර්ධන,
වැඩබලන කම්කරු කොමසාරිස්.

1-511

අංක : සී/අයි. 1190.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි**

මෙම නියෝගය අනුබද්ධිත වැඩබලන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව කොළඹ 11, වරාය බෙල්ජ්ව් කැනල් පාරේ, 110 හි වරාය එක්සත් කම්කරු සමිතිය හා කොළඹ 13, කොටහේනේ, බොන්ජියන් පාරේ, 31 හි, ජේ. ඇම්. පී. රත්නායක මහතා අතර කාර්මික ආරවුලක් පවතින හෙයින්ද,

කම්කරු ඇමති නැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කොළඹ 3, 8 වැනි පටු මග අංක 6 හි, ඇම්. මතියාපරනම් මහතා වෙත මෙයින් යොමුකරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1972 දෙසැම්බර් මස 28 දින,
කොළඹ දීය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරය—කාර්මික ආරවුල් පනත**

වරාය එක්සත් කම්කරු සමිතිය,
110, බෙල්ජ්ව් කැනල් පාර, වරාය,
කොළඹ 11.

සහ

ජේ. ඇම්. පී. රත්නායක මහතා,
31, බොන්ජියන් පාර,
කොටහේන, කොළඹ 13.

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණ නම්, පහත සඳහන් සේවකයින් විසින්, ජේ. ඇම්. පී. රත්නායක මහතාට කරනලද සේවය වෙනුවෙන් ඔවුන් එකිනෙකාට කුමන වන්දියක් සහ/හෝ පාරිතෝෂික මුදලක් හිමි ද යන්න පිළිබඳව වේ.

1. ඩී. ඒ. සයිමන්
2. පී. නූර්
3. කේ. ඇම්. ඩී. පෙරේරා
4. පී. ඉරලාන්ච්
5. පී. රාජේන්ද්‍රම්
6. පී. පෙරුමාල්
7. එස්. ජෝසප්
8. පී. එච්. සුවාරිස් අප්පුහාමි
9. එච්. ඩී. සෝමපාල
10. කේ. ඩී. පෙරේරා
11. ඒ. එස්. ජයසිංහ
12. ඒ. රොමියල්
13. එච්. ඩබ්ලිව්. ඩැනියල්

1972 දෙසැම්බර් මස 16 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ජේ. පී. එ. සිරිවර්ධන,
වැඩබලන කම්කරු කොමසාරිස්.

1-512

---

අංක ඩබ්ලිව්. 105/1176.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි**

මෙම නියෝගය අනුබද්ධිත වැඩබලන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිතකර දක්වා ඇති කාරණය පිළිබඳව එක් පාර්ශ්වයක් වශයෙන් මහනුවර කන්දේවීදියේ අංක 13හි ලංකා වතු සේවා සංගමය සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 3, ගාලු පාරේ අංක 265හි මොරපාත කොමර්ෂල් කොම්පැණි ලිමිටඩ් බාරේ ලිඳුල, මැක්ඩෆ් වත්තේ අයිතිකරුවන්වන පර්සි පී. ප්‍රනාන්දු මහතා සහ ඇස්. සී. ප්‍රනාන්දු මහත්මිය අතර කාර්මික ආරවුලක් පවතින හෙයින්ද,

කම්කරු ඇමති නැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා කම්කරු විනිශ්චය සභා අංක X හැටන් වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1972 දෙසැම්බර් මස 28 දින,
කොළඹ දීය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරය—කාර්මික ආරවුල් පනත**

එක් පාර්ශවයක් වශයෙන් මහනුවර කන්දේ වීදියේ අංක 13 හි ලංකා වතු සේවා සංගමය

සහ

අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 3, ගාලු පාරේ අංක 265 හි මොරපාත කොමර්ෂල් කොම්පැණි ලිමිටඩ් බාරේ ලිඳුල, මැක්ඩෆ් වත්තේ අයිතිකරුවන් වන පර්සි පී. ප්‍රනාන්දු මහතා සහ ඇස්. සී. ප්‍රනාන්දු මහත්මිය,

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණ වනුයේ, ඉහත සඳහන් කරනලද වෘත්තීය සමිතියේ සාමාජිකයෙක් වන, ලිඳුල මැක්ඩෆ් වත්තේ පාලක පක්ෂය විසින් 1965 ඔක්තෝබර් 25 වන දින සිට 1971 අප්‍රේල් 26 වන දින දක්වා ගුරුවරයෙකු/ ලිපිකරුවෙකු වශයෙන් සේවයේ යොදවා සිටි එස්. සෙල්වරත්නම් මහතාට ප්‍රමාණවත් වේතන ගෙවන ලද්දේද යන්නත්, එසේ නොගෙවා ඇත්නම් ඔහුට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

1972 දෙසැම්බර් මස 16 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ජෝ. පී. ඒ. සිරිවර්ධන,
වැඩබලන කම්කරු කොමසාරිස්.

1-336

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

ණය අංකය : 2851.

**ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාව**

**(402 අධිකාරය වන) කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථා ආඥා පනතේ 71 වන වගන්තිය යටතේ යෝජනාව**

1972 අගෝස්තු 29 වෙනි දින ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගත් බව මෙයින් නිවේදනය කරනු ලැබේ:—

"ප්‍රසිද්ධ නොතාරිස් නැන්පත්, ඇම්. ජේ. පීරිස් විසින් ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාව නමට ලියා සහතික කරන ලද අංක 12479 හා 64.4.20 දින දරන බැඳුම්කරයෙහි සඳහන් ගෙවීම් තැගල්ලේ පදිංචි රනවබැඩිගේ ගුණදාස වීරවර්න තිලවීර නමැති අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය යටතේ රුපියල් හතලිස් එක්දාස් දෙසිය හැටපහයි සත අනූ අටක (රු. 41,265.98) මුදලක් එකී සංස්ථාවට දැනට අයවිය යුතු හෙයින් ද, ඒකී අංක 12479 දරන බැඳුම්කරය මගින් එකී සංස්ථාවට උකස් කර ඇත්තාවූ බදුල්ල දිස්ත්‍රික්කයේ වැල්ල වාය කෝරළයේ බුලත්වෙල්ගොඩ සහ හීවෙල්කඳුර නමැති ගම්වල පිහිටි රෝස්බරි එස්ටේට් නමැති අ. 700, රු. 1, ප. 29.8 ප්‍රමාණවත් දේපළ සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, බංගලා, දුම් කාමරය, කර්මාන්තශාලාව, යන්ත්‍රෝපකරණ, කම්කරු නිවාස සහ අනිකුත් සවිකර ඇති දේ සමග බදුල්ලේ පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ජේ. ඇම්. අබේතුංග මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමටත්, එසේ විකුණා එසේ විකුණන අවස්ථාවේදී එයින් ආපසු නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් සහ එවකට අයවිය යුතුව ඇති පොලියත්, එකී ආඥාපනතේ 78 වන වගන්තියේ විධිවිධාන යටතේ ප්‍රචාරක, විකුණුම් හා වෙනත් ගාස්තුද සමග අයකර ගැනීමටත් කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි."

එච්. ඇස්. ඇප්. ගුණවර්ධන,
සාමාන්‍යාධිකාරී.

1972 දෙසැම්බර් 21,
කොළඹ 3.

1-492

**කළුතර උතුර ශ්‍රී සුමංගල පාර, දුම්රිය හරස් මඟෙහි රථ වාහන පාලනය කිරීම**

ඉහත සඳහන් දුම්රිය හරස් මාර්ගයට අනතුරු ඇඟවීමේ සීනුවකින් හා නිවෙන පත්තුවෙන රතු ආලෝකය සහිත ලාම්පුවකින් ආරක්ෂාව සපයා ඇත.

2. දුම්රිය මාර්ගයේ සිට අඩි 10 ක් මෙපිටින් කණුවක් මත තිරස්ව, නිවෙන පත්තුවෙන රතු වර්ණයෙන් යුත් ලාම්පුවක් මහා මාර්ගයේ ගමන් කරන වාහක රියදුරන්ගේ දකුණු පසින් සවිකර ඇති අතර, එම කණුවේ සිට අඩි 10 ක් මෙපිටින් මහා මාර්ගය හරහා "නැවතීමේ රේඛාව" Stop Line යනුවෙන් හඳුන්වනු ලබන සුදු පැහැති රේඛාවක් ඇඳ ඇත.

3. දුම්රිය හරස් මගට අඩි 300 ක් එපිටින් කවර දෙසින් හෝ දුම්රියක් පැමිණෙන විට නිවෙන පත්තුවෙන රතු සංඥාවට අමතරව අනතුරු හැඟවීමේ සීනු නොනවත්වා නාදවෙනවා ඇත. එකී නිවෙන පත්තු වෙන සංඥාව හා සීනුව නාදවීම නතරවෙන තුරු රථවාහන නැවතීමේ රේඛාවෙන් ඉදිරියට නොයා යුතුය.

4. මෙම රතු සංඥාව හා සීනුව නාදවීම ක්‍රියා විරහිත වූ අවස්ථාවක රථවාහන රියදුරන්, අතින් කරනු ලබන සංඥාවකට අනුව ප්‍රවේස මෙන් දුම්රිය හරස් මඟ පසුකල යුතු ය.

මහා මාර්ග අධ්‍යක්ෂ.

1972. 12. 6,

1-320

**සමාගම් ආඥාපනත (145 වැනි අධිකාරය)**

277(3) වගන්තිය යටතේ ලයන් වූවර්ස් ඇන්ඩ් රිසෝර්ස් ලිමිටඩ් නම් කපා හැරීමේ දැන්වීම

සමාගම් ආඥාපනතේ (145 අධිකාරය) විධිවිධාන යටතේ 1967. 4. 4 දින සංස්ථාපිත සමාගමක් වන ලයන් වූවර්ස් ඇන්ඩ් රිසෝර්ස් ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමණාවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ලයන් වූවර්ස් ඇන්ඩ් රිසෝර්ස් ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම් විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් තැන්පත් රුවන්පුර ලික්මන්ඩ් ද සිල්වා වන මම, සමාගම් ආඥාපනතේ (145 අධිකාරය) 277(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ආර්. ඇල්. ද සිල්වා,
සමාගම් රෙජිස්ට්‍රාර්.

1972 දෙසැම්බර් මස 18 දින,
කොළඹ, සමාගම් රෙජිස්ට්‍රාර්ගේ
දෙපාර්තමේන්තුවේ දී ය.

1-379

---

විවාහ සිදුකිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියා පදිංචි කිරීමේ ආඥාපණතේ (112 වැනි පරිච්ඡෙදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව ෂාහුල් හමීඩ් මොහමඩ් සුබෙර් ෆාරුක් නමැති, ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දනුම් දෙනු ලැබේ :—

| අංකය | ලියාපදිංචි කිරීමේ දිනය | විස්තරය | පිහිටීම | දේවගැතිතැන, අයිතිකරු හෝ භාරකරු | ගොඩනැගිල්ල ලියා පදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන්ද |
|---|---|---|---|---|---|
| 999 ... | 12. .1972 ... | ශුද්ධවූ දසවන පියුස් මුනිඳුන්ගේ දෙව්මැදුර | හොරගොල්ල, යටකලන්පත්තුව, දකුණු පිටිගල් කෝරලය, හලාවත දිස්ත්‍රික්කය | ගරු ඇම්. කුයින්ටස් පෙරේරා | රෝමානු කතෝලික |

එස්. එච්. එම්. එස්. ෆාරුක්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ කායර්‍යාලය,
කොළඹ, 1972.12.21.

1–473

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතුනම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ. යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| ජනවාරි | 73. 1. 5 සිකුරාද | 72.12.29 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 1.12 සිකුරාද | 73. 1. 5 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 1.19 සිකුරාද | 73. 1.12 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 1.26 සිකුරාද | 73. 1.19 සිකුරාද | දහවල් 12.00 |
| පෙබරවාරි | 73. 2. 2 සිකුරාද | 73. 1.26 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 2. 9 සිකුරාද | 73. 2. 2 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 2.15 බ්‍රහස්පතින්ද | 73. 2. 9 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 2.23 සිකුරාද | 73. 2.15 බ්‍රහස්පතින්ද | දහවල් 12.00 |
| මාර්තු | 73. 3. 2 සිකුරාද | 73. 2.23 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 3. 9 සිකුරාද | 73. 3. 2 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 3.16 සිකුරාද | 73. 3. 9 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 3.23 සිකුරාද | 73. 3.16 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 3.30 සිකුරාද | 73. 3.23 සිකුරාද | දහවල් 12.00 |
| අප්‍රේල් | 73. 4. 6 සිකුරාද | 73. 3.30 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 4.11 බදාද | 73. 4. 6 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 4.19 බ්‍රහස්පතින්ද | 73. 4.11 බදාද | දහවල් 12.00 |
| | 73. 4.27 සිකුරාද | 73. 4.19 බ්‍රහස්පතින්ද | දහවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් 20 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි